# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2026.03.07 පැය 0530 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/400/2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>**

**01. මනුෂ්‍ය ඝාතනයක් - මින්නේරිය පොලිස් වසම.**

2026.03.06 දින රාත්‍රී කාලයේ මින්නේරිය පොලිස් වසමේ රොටවැව ප්‍රදේශයේ නිවසක් තුලදී සිදුවූ පහරදීමකින් පුද්ගලයකු මියගොස් ඇති බවට මින්නේරිය පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 70 ක් වූ රොටවැව, ගල්ඔය හන්දිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු යාබද නිවසක පදිංචිව සිටින තම සහෝදරියට ඇයගේ මන්ද මානසික රෝගී තත්වයෙන් සිටින පුත්‍රයා විසින් පහරදෙන බවට දැනගැනීමෙන් පසු ඒ පිළිබඳව සොයා බැලීම සඳහා සහෝදරියගේ නිවසට ගිය අවස්ථාවේ සහෝදරියගේ එම පුත්‍රයා විසින් පොල්ලකින් පහරදී මෙම ඝාතනය සිදු කර ඇති බවට දැනට සිදු කරන ද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය මහේස්ත්‍රාත් පරීක්ෂණය සඳහා පොලිස් ආරක්ෂාව යටතේ සිද්ධිය වූ ස්ථානයේ ඇති අතර පහරදීමෙන් තුවාල ලැබූ සැකකරුගේ මව හිඟුරක්ගොඩ රෝහලේ ප්‍රතිකාර ලබයි. ඝාතනයට සම්බන්ධ සැකකරු අත්අඩංගුවට ගෙන ඇත. මින්නේරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරයි.

**02. තලංගම, අකුරේගොඩ ප්‍රදේශයේදී වෙඩි තබා ද්විත්ව මනුෂ්‍ය ඝාතනයකට ආධාර අනුබල දුන් සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසය.**

2026.02.13 වන දින තලංගම අකුරේගොඩ ප්‍රදේශයේදී නීතිඥවරයෙකු හා ඔහුගේ බිරිඳ වෙඩි තබා ඝාතනය කිරීමේ අපරාධය සම්බන්ධයෙන් පොලිස් කණ්ඩායම් කිහිපයක් මඟින් විමර්ශනයක් ආරම්භ කර තිබුණි.

ඒ අනුව බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසය මඟින් සහ හෝමාගම කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය මඟින් අපරාධයට සම්බන්ධ වෙඩික්කරුවන් දෙදෙනා ඇතුළු අපරාධයට ආධාර අනුබල දුන් සැකකරුවන් 06 දෙනෙකු අත්අඩංගුවට ගෙන තිබුණි.

අපරාධයෙන් පසු එක් වෙඩික්කරුවෙකු මොණරාගල ප්‍රදේශය දක්වා බස් රථයකින් ප්‍රවාහනය කර අපරාධයට ආධාර අනුබල දීම සම්බන්ධයෙන් සැකකරුවන් දෙදෙනෙකු 2026.03.06 දින අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 39 හා 53 වයස්වල පසුවන ඉබ්බාගමුව හා මාකොළ ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

එක් සැකකරුවෙකු විසින් දැනට විදෙස්ගතව සිටින සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයෙකු විසින් ලබා දෙන ලද මුදලින් මිලට ගත් බස් රථයකින් වෙඩික්කරු ප්‍රවාහනය කර ඇති බවට අනාවරණ වී ඇති අතර අදාල බස් රථය විමර්ශන නිලධාරීන් භාරයට ගෙන ඇත.

බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. දිය අනතුරකින් විදේශ ජාතිකයින් දෙදෙනෙකු බේරා ගැනීම - හික්කඩුව පොලිස් ජීවිතාරක්ෂක ඒකකය.

2026.03.06 වන දින සවස් කාලයේ හික්කඩුව වරාය ආසන්න මුහුදු තීරයේ දියනෑමට ගිය විදේශ ජාතිකයින් දෙදෙනෙකු දිය වැලකට හසුවී මුහුදට ගසාගෙන යමින් සිටියදී වෙරළ තීරයේ රාජකාරී යෙදී සිටි හික්කඩුව පොලිස් ජීවිතාරක්ෂක ඒකකයට අනුයුක්ත පොලිස් කොස්තාපල් 9372 ලාල් සහ පොලිස් කොස්තාපල් 79128 ජයනන්ද යන නිලධාරීන් විසින් එම දෙදෙනා බේරාගෙන ඇත.

**අනතුරට පත්ව ඇත්තේ අවුරුදු 39 හා 40 වයස්වල පසුවන රුසියානු ජාතිකයින් දෙදෙනෙකි.**

## 04. ගෝඩා සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - කටුනායක පොලිස් ස්ථානය

2026.03.06 දින දහවල් කටුනායක පොලිස් වසමේ දඩුගංඔය ප්‍රදේශයේදී කටුනායක පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර නීති විරෝධී මත්පැන් පෙරීමට යොදාගන්නා ගෝඩා ලීටර් 945 (බැරල් 05) ක් සමඟ සැකකරුවෙකු හා ගෝඩා ලීටර් 1890 (බැරල් 10) ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 39 හා 55 වයස්වල පසුවන මිනුවන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවන්වේ.**

කටුනායක පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.